HDFC BANK

# HDFC බැංකුව

නවීය මූල්‍ය විසඳුම් හරහා ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු සමස්ත ශ්‍රී ලාංකිකයින්ගේ අභිලාෂ ඉටු කර ගැනීම සඳහා දශක තුනකට අධික කාලයක් පුරා දැයට මහඟු සේවයක් ඉටු කරන **HDFC** බැංකුව හා සම්බන්ධ වී ඔබේ වෘත්තීය ජීවිතය ඉදිරියට ගෙන යාමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

බැංකුකරණ ක්ෂේත්‍රයේ සැබෑ වෙනසක් ඇති කිරීමට **HDFC** බැංකුව සූදානමින් සිටින බැවින් පහත සඳහන් තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලී, බැංකුකරණ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට අප හා එක් විය හැකිය.

**අංශ ප්‍රධානී - ණය සහ අය කර ගැනීම් [නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ශ්‍රේණිය]**

**ප්‍රධාන වගකීම්**

- සමස්ත ණය හා අය කර ගැනීම්, නිශ්චිත කාර්ය සාධනය හා අයවැය ඉලක්ක සපුරා ගැනීම සහ අනෙකුත් කටයුතු විධිමත් කිරීම සඳහා නිසි උපාය මාර්ගික සැළසුම්, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සකස් කිරීම.
- බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි ණය අය කර ගැනීම් සහ අවදානම් කළමනාකරණය තුළින් ගුණාත්මක ණය අංශයක් ස්ථාපනය කිරීම.
- ණය හා අය කර ගැනීම් අංශයේ කාර්ය මණ්ඩලයට නිසි පුහුණුව ලබා දීම තුළින් ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම, කාර්ය පටිපාටි, ප්‍රතිපත්ති හා නියාමන මාර්ගෝපදේශවලට අනුගත වීම තහවුරු කිරීම තුළින් බැංකුව තුළ විධිමත් ණය හා අය කර ගැනීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- දැනට පවතින ණය හා අය කර ගැනීමේ අවදානම් කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම, අඩුපාඩු හඳුනා ගැනීම හා වාර්තා කිරීම, ඒවා මඟ හරවා ගැනීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම. එවැනි අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය හා සුදුසු විසඳුම් ක්‍රියාත්මක කිරීම මඟින් සම්පූර්ණ ණය හා අය කර ගැනීමේ අවදානම කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම.
- ඒ ඒ අංශය සඳහා වන හොඳම භාවිත හඳුනා ගැනීම සහ සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලබන පාලන රාමුවට අදාළ අනුකූලතා සකස් කිරීම.
- අනුමත අයවැය මත පදනම්ව අදාළ කාර්ය පටිපාටි හා සේවාවල ගුණාත්මකභාවය හා ණය වර්ධනය කළමනාකරණය කිරීම.
- ණය හා අය කර ගැනීමේ කටයුතු පිළිබඳව ශාඛාවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- වෙළෙඳපොළ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පවතින ණය මාදිලි සකස් කිරීම සහ නව මාදිලි සංවර්ධනය කිරීමට පහසුකම් සැළසීම.
- ශාඛා ජාලය ඇතුළත් ණය සහ අය කර ගැනීමේ අංශයට නායකත්වය ලබා දීම. ආයතනික උපාය මාර්ගික දිශානතිය සහ ණය හා අය කර ගැනීමේ ක්‍රියාකාරකම් කළමනාකරණයට සහාය වන ඉලක්ක සැකසීම.

**සුදුසුකම්**

- ව්‍යාපාර කළමනාකරණය, මූල්‍යකරණය, ගිණුම්කරණය, නීතිය, අලෙවිකරණය, ආර්ථික විද්‍යාව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක් සඳහා පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම හෝ සම්පූර්ණ වෘත්තීය සුදුසුකමක් සපුරා තිබීම.
- ණය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, මූල්‍යකරණය, අලෙවිකරණය, බැංකුකරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- ණය සහ අය කර ගැනීමේ අංශ ආවරණය වන පරිදි පිළිගත් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක සේවය කර වසර 15කට වැඩි පළපුරුද්දක් ලබා තිබීම සහ කළමනාකාර තනතුරක වසර 8ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව**

- අවුරුදු 56ට අඩු වීම වඩාත් සුදුසු වේ.

සිත් ගන්නා වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය**

- විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 06.12.2023 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

HDFC බැංකුව
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැපැල් පෙට්ටිය 2085
කොළඹ 02
දුරකථනය : 0112356800